# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2407/27 - 2024 ඔක්තෝබර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2024.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : ඩීඅයිවීඑන්ජ්/එල්ඒඩී/එල්ඒ/ ඒසීකිව්යූඅයි/4/1/33.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2020/එච්ඩබ්/24.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :-

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1052, පැලවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැලවත්ත ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සකස් කරන ලද 2023.12.29 දිනැති කැඩැස්තර සිතියම අංක 420777, කලාප අංක 03, පත්‍ර අංක 01 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0572 ක් වූ කැබලි අංක 1 සිට 8 දක්වා වූ කැබලි 8 :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කුඩාඔය; ඉඩමේ විස්තරය: ඔය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: —; ප්‍රමාණය: හෙක්. 0.0153.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මුරවත්ත *නොහොත්* කොලොන්ගහමුලවත්ත; ඉඩමේ විස්තරය: ඔය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0032.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: මුරවත්ත *නොහොත්* කොලොන්ගහමුලවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: —; ප්‍රමාණය: හෙක්. 0.0031.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: මුරවත්ත *නොහොත්* කොලොන්ගහමුලවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0071.

05. **කැබලි අංක 05**
ඉඩමේ නම: —; ඉඩමේ විස්තරය: මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: —; ප්‍රමාණය: හෙක්. 0.0250.

06. **කැබලි අංක 06**
ඉඩමේ නම: මුරවත්ත *නොහොත්* කොලොන්ගහමුලවත්ත; ඉඩමේ විස්තරය: වත්ත (මිශ්‍ර භෝග වගාවක් ඇත); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: බෝගොඩලේකම්ගේ ධනුසේකර බංඩාර; ප්‍රමාණය: හෙක්. 0.0001.

07. **කැබලි අංක 07**
ඉඩමේ නම: —; ඉඩමේ විස්තරය: මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: —; ප්‍රමාණය: හෙක්. 0.0015.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

08. **කැබලි අංක 08**
ඉඩමේ නම: —; ඉඩමේ විස්තරය: වත්ත (මිශ්‍ර භෝග වගාවක් ඇත); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පූජා ගල්ගමුවේ සිවංකර හිමි අනවසරයෙන් භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0019.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ.ව. 10.00 ට නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2024 නොවැම්බර් මස 06 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එම්. ආර්. එම්. ඉම්රාන්,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2024 ඔක්තෝබර් මස 18 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0196

---

## ශුද්ධි පත්‍රයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : WGSWD&EIP/ACQ/MH/08.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ අංකය* : 4/3/10/2012/LRB/223.

අංක 9623 මුලික පිඹුරේ ඇතුළත් බිම් කොටස් සඳහා වන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම් අංක 2226/24 හා 2021.05.04 දිනැති *ගැසට් පත්‍රයේ* පළකර ඇත.

එම *ගැසට් පත්‍රයේ* දැක්වෙන කැබලි අංක 34 හා 51 සඳහා වන 7 වන වගන්තිය යටතේ දැන්වීම් අංක CO/DSO/2023/647 දරන අනුරේඛනය අනුව පහත පරිදි සංශෝධනය කරන බැව් මෙයින් දැනුම් දී සිටිමි.

01. **කැබලි අක්ෂරය A (අංක 9623 මූලික පිඹුරේ කැබලි අංක 34 න් සංශෝධිත)**
ඉඩමේ නම: ඔටුදෙන බෙලිගහකුඹුර *හෙවත්* මහකුඹුර සහ මිදෙල්ගහකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එම්.එන්. මුණසිංහ මයා, අංක 45/25සී, හික්ගහවත්ත මාවත, පැපිලියාන; ප්‍රමාණය: හෙක්. 0.0506.

02. **කැබලි අක්ෂරය B (අංක 9623 මූලික පිඹුරේ කැබලි අංක 51 න් සංශෝධිත)**
ඉඩමේ නම: ඔටුදෙන බෙලිගහකුඹුර *හෙවත්* මහකුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ජී. ජේ. පෙරේරා මයා, අංක 36සී, වීරසේකර මාවත, දිවුල්පිටිය; ප්‍රමාණය: හෙක්. 0.0177.

එච්. තිලකවර්ධන,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වෙරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
වෙරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 10 - 0197

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2399/46 හා 2024.08.31 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 2A පිටුවේ පළකරන ලද ශුද්ධි පත්‍රිකාවේ දක්වා ඇති කැබලි අංක K දරන ඉඩමේ ප්‍රමාණය පහත පරිදි නිවැරදි කරමි.

01. **කැබලි අංක** K
ඉඩමේ නම: කීනගහලන්ද; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0066.
ප්‍රගමන අනුරේඛන අංක CO/HMG/2023/618 හි කැබලි අංක 276 හි කොටසක්

බී. ඒ. ඩී. චින්තක,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2024 ඔක්තෝබර් මස 12 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0198

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.